# පළමු ක්‍රියාවලිය - පිළිතුරු පත්‍රය ස්කෑන් (Scan) කර එක් PDF ලේඛනයක් (Document) ලෙස සකසා ගැනීම
















**පියවර 01 -**
ඉහත රූපයෙහි පරිදි ජංගම දුරකථන තිරය මත දිස්වන Play store යෙදුම මත Click කරන්න. එයට ඔබට Play Store වෙත ප්‍රවේශ විය හැකිය.

**පියවර 02 -**
Play Store හි සෙවුම් තීරුව (Search bar) මත CS Scanner ලෙස Type කර Search කරන්න. එවිට CS scanner හෙවත් Cam scanner යෙදුම ඉහත රූපයෙහි දැක්වෙන පරිදි ඔබගේ ජංගම දුරකථන තිරය මතට ලැබේ. අනතුරුව Install බටනය Click කිරීම මඟින් CS scanner යෙදුම ඔබගේ ජංගම දුරකථනයට ස්ථාපනය කර ගත හැකිය.

**පියවර 03 -**
ඔබගේ ජංගම දුරකථනයට CS scanner යෙදුම ස්ථාපිත වූ පසු ඉහත රූපය පරිදි Play Store තිරය මත දිස්වේ. එහි ඇති Open බටනය Click කිරීම මඟින් පහසුවෙන් ම CS scanner යෙදුම වෙතට පිවිසිය හැකිය.
සැ.යු.- එහෙත් ඔබගේ පහසුව තකා ජංගම දුරකථන තිරය මත ස්ථාපිත CS scanner යෙදුම හරහා පිළිතුරු පත්‍රය ස්කෑන් කර ගන්නා ආකාරය ඉදිරි පියවර තුළ දී සාකච්ඡා කරනු ලැබේ.

**පියවර 04 -**
ජංගම දුරකථනයෙහි ස්ථාපිතව තිබෙන CS scanner යෙදුම ඉහත රූපය පරිදි දැක ගත හැකි අතර එම යෙදුම මත Click කරන්න.

**පියවර 05 -**
Cam scanner යෙදුම පළමුවරට විවෘත කරන විට ඉහත රූපයෙහි දැක්වෙන පරිදි ජංගම දුරකථන තිරය ලැබුනේ නම් පියවර තුනක් වම් පසට Swiped කරන්න.

| | | | | |
|---|---|---|---|---|
|  |  |  |  |  |
| **පියවර 06 -**<br>පියවර තුනකින් පසු ඉහත රූප රාමුවේ පරිදි යෙදුම් තිරය දක්නට ලැබේ. මෙහි ඉහළ කොටසේ වම් කෙළවරෙහි ඇති "X" සලකුණ මත Click කර මෙම රූප රාමුවෙන් ඉවත් වන්න. (මෙම යෙදුම මිලදී නොගන්නා බැවින් Continue යන බටනය ඔස්සේ නොයන්න).<br><br>සැ.යු. ඉහත Swiped කරන ලද රූප රාමු හතර දර්ශනය වනුයේ Cam scanner යෙදුම ස්ථාපනය කර ප්‍රථමවර විවෘත කරන අවස්ථාවේ දී පමණි | **පියවර 07 -**<br>ඉහත දර්ශන තිරය ලැබුණු පසු "Use Now" යන්න Click කරන්න. | **පියවර 08-**<br>Cam scanner යෙදුම විවෘත වූ පසු මෙලෙස දර්ශනය වන අතර පහතින් දැක්වෙන කැමරා සලකුණ Click කිරීම මගින් ඔබගේ පිළිතුරු පත්‍රයට අදාළ පිටු ස්කෑන් කිරීම ආරම්භ කළ හැකිය.<br>සැ.යු. යෙදුම විවෘත කරන පළමු අවස්ථාවේ දී ජංගම දුරකථනයෙහි කැමරාව වෙත පිවිසීමට යෙදුම විසින් අවසර ඉල්ලා සිටින අවස්ථාවල දී "Allow" යන්න Click කර ඊට අවසර ලබා දෙන්න. | **පියවර 09 -**<br>මේ වන විට පිළිතුරු පත්‍රය ස්කෑන් කිරීම සඳහා CS scanner යෙදුම විවෘත වී ඇත. ඔබගේ පිළිතුරු පත්‍රය පැහැදිලි ආලෝකය ලැබෙන ස්ථානයක සමතලා පෘෂ්ඨයක් මත තබා ජංගම දුරකථන කැමරාව ඉහත රූපයෙහි පෙනෙන පරිදි පිළිතුරු පත්‍රයෙහි පිටුවක් වෙත යොමු කොට කැමරා සලකුණ සහිත බටනය Click කිරීමෙන් පිළිතුරු පත්‍රයෙහි අදාළ පිටුව ස්කෑන් කර ගත හැකිය. | **පියවර 10 -**<br>පිළිතුරු පත්‍රයේ එක් පිටුවක් ස්කෑන් වූ විට පිටුවෙහි සීමා දක්වමින් ඉහත රූපයෙහි ආකාරයට යෙදුම් තිරය දර්ශනය වනු ඇත.<br><br>පිළිතුරු පත්‍ර පිටුවෙහි සීමා වෙනස් වී ඇත්නම්, වෘත්තාකාර සලකුණු ඔස්සේ ඔබට එය නිවැරදි කළ හැකිය. අනතුරුව තිරයෙහි දකුණු පස කෙළවරෙහි ඇති "Next" බටනය මත Click කරන්න. |




**පියවර 11 -**
ස්කෑන් වූ පිළිතුරු පත්‍ර පිටුව ඉහත රූපයේ දැක්වෙන පරිදි දර්ශනය වූ විට එහි දකුණු පස පහළ කෙළවරේ ඇති "✓" සලකුණ සහිත බටනය Click කරන්න.




**පියවර 12-**
දැන් ඔබගේ එක් පිළිතුරු පිටුවක් ස්කෑන් වී අවසන් ය. එය පිටු අංක 01 ලෙස ඉහත රූපයෙහි පරිදි ඔබට දර්ශනයවේ. දැන් ඔබගේ දෙවැනි පිළිතුරු පිටුව ස්කෑන් කිරීමට ආරම්භ කරන්න. ඒ සඳහා රූපයෙහි දිස්වෙන පරිදි යෙදුම් තිරයේ පහළ කොටසේ දකුණු පස කෙළවරේ ඇති කැමරා සලකුණ නැවත Click කරන්න. අනතුරුව පිළිතුරු පත්‍රයේ පළමු පිටුව ස්කෑන් කිරීමේ දී අනුගමනය කරන ලද පියවරයන් එපරිද්දෙන් ම අනුගමනය කරමින් දෙවන පිටුවත් ස්කෑන් කරන්න. මෙ අයුරින් ඔබට පිළිතුරු පත්‍රයට අදාළ සියලු පිටු ස්කෑන් කර ගත හැකිය.




**පියවර 13 -**
මෙවන විට ඔබගේ පිළිතුරු පත්‍රයට අදාළ සියලු පිටු ස්කෑන් කර අවසන් ය. දැන් ඉහත රූපයෙහි දැක්වෙන පරිදි යෙදුම් තිරයෙහි ඉහළ කොටසේ ඇති PDF යන සලකුණ සහිත බටනය Click කරන්න.




**පියවර 14 -**
දැන් ඔබට ඉහත රූපයෙහි දැක්වෙන පරිදි යෙදුම් තිරය දැක ගත හැකිය. එහි ඉහළ කෙළවරේ දකුණු පස ඇති "share" යන බටනය Click කරන්න.




**පියවර 15 -**
ඉහත රූපයෙහි දැක්වෙන පරිදි ඔබගේ PDF කරන ලද පිළිතුරු පත්‍රය Save කළ යුතු ස්ථානයක් තෝරා ගැනීමට අවස්ථාව යෙදුම් තිරය විසින් සපයනු ලැබේ. මෙහි "Save to local" යන්න Click කරන්න. එවට ස්වයංක්‍රියව ම PDF කරන ලද ඔබේ පිළිතුරු පත්‍රය ඔබේ ජංගම දුරකතනයෙහි Save වේ.




**පියවර 16 -**
රූපයෙහි දැක්වෙන පරිදි ඔබගේ ජංගම දුරකථනයෙහි "My files" යන්න තෝරන්න. තෝරා එය Click කරන්න.




**පියවර 17 -**
දැන් ඔබගේ ජංගම දුරකථන තිරය ඉහත රූපය මෙන් දිස්වේ. මෙහි "Internal storage" යන්න Click කරන්න.




**පියවර 18 -**
එවිට ඔබට ඉහත රූපයෙහි දැක්වෙන පරිදි ගොනු (Folders) කිහිපයක් දැකිය හැකිය. එයින් "Cam Scanner" යන ගොනුව (Folder) Click කර එය තුළට පිවිසෙන්න.




**පියවර 19 -**
දැන් ඔබට ඉහත රූප රාමුවේ දැක්වෙන පරිදි pdf කරන පද ඔබගේ පිළිතුරු පත්‍රය දැකිය හැකිය.
ඔබගේ පිළිතුරු පත්‍රය ස්කෑන් කර ගැනීමේ පළමු ක්‍රියාවලිය මෙසේ අවසන් වේ.